**කටුවන ප්‍රාදේශීය සභාව - 2023**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කටුවන ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට කටුවන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය

හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කිරම නගරයේ ඉදිකිරීම් අවසන් කර තිබූ කඩ කාමරය සඳහා දරන ලද රු.1,075,750 ක් හා වැලිපිටිය ජල ව්‍යාපෘතිය සඳහා නළ ළිඳක් ඉදිකිරීමට වැයකර තිබූ රු.991,300 ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | කඩ කාමරය සඳහා දරන ලද වියදම ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බවත්, ළිඳ ඉදිකිරීමේදී දරන ලද වියදම තුළ කිසිඳු උපකරණයක් හෝ ස්ථාවර වත්කමක් ඇතුළත් නොවන බව | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයන් වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගත නොවීම මත ප්‍රතිපූර්ණය කළ නොහැකි රු.671,880 ක් ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබීමෙන් පසු ජර්නල් සටහන් මඟින් අවසන් ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කරන බව | ලැබිය යුතු ශේෂ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සැපයුම් ණයහිමියන් සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට රු.163,375 ක් අඩුවෙන් ණයහිමි ප්‍රතිපාදන වෙන්කර තිබුණි. | ජර්නල් සටහන් මගින් ඉදිරියේදී නිවැරදි කරන බව. | ණයහිමි ප්‍රතිපාදන නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | 2022 වර්ෂයේ අගෝස්තු මස සිට 2025 අගෝස්තු මස දක්වා වසර 03 ක් වෙනුවෙන් බදුදුන් ජංගම මත්ස්‍ය අලෙවිසැලෙන් ලද රු.130,539 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා වර්ෂයට අදාළ ආදායම රු.86,859 ක් වැඩියෙන් දැක්වුණි. | ජර්නල් සටහන් මගින් ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයන් 05 කට අදාළ ශේෂයන් හා ඊට අදාළ උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.591,980 ක වෙනසක් විය. | නිරීක්ෂණය පිළිගන්නා බව. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම නිවැරදි කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/ 2010/01 දරන පළාත් පාලන කොමසාරිස්ගේ (දකුණු) චක්‍රලේඛයේ 04 ඡේදය | කඩ කාමර බදු දුන් දිනයේදී හෝ මාස 06 ක් ඇතුළත උපරිම වාර 06 කට යටත්ව එක්වන් මුදල් අයකළ යුතු වුවත්, 2017 හා 2022 යන වර්ෂවල බදු දුන් කඩ කාමර 10 කින් ලැබිය යුතු රු.9,534,333 එක්වන් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු.49,000 ක් අයකර ඇති අතර ඉතිරි හිඟ මුදල් අයකර ගැනීම සඳහා උපදෙස් ලබා ගැනීමට ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් වෙත ලිපි යොමු කොට ඇති අතර ලැබෙන උපදෙස් මත ඉදිරි කටයුතු සිදුකරන බව. | පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2023 ජනවාරි 27 දිනැති අංක 01/2023 දරන අයවැය චක්‍රලේඛයේ 02 (ඇ) (viii) ඡේදය | මාණ්ඩලික නිලධාරීන් වෙත ණය පහසුකම් ලබාදීම නොකළ යුතු වුවත්, සභාවේ ලේකම් වෙත රු.187,500 ක ආපදා ණය සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබුණි. | සභා ලේකම්ගේ ඉල්ලීම මත ඉතිරි ආපදා ණය මුදල ලබාදුන් බව. | අයවැය චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.19,360,919 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,814,836 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වෙනත් බදු | 1,709,250 | 1,573,980 | 1,580,510 | 4,030 | 1,265,150 | 1,583,055 | 1,592,385 | 10,560 |
| කුලී | 17,865,200 | 14,760,888 | 14,931,798 | 1,929,988 | 15,736,200 | 14,201,599 | 13,977,834 | 2,100,898 |
| බලපත්‍ර ගාස්තු | 1,524,150 | 2,224,937 | 2,346,137 | 100,300 | 1,461,350 | 2,278,420 | 2,531,220 | 221,500 |
| වෙනත් ආදායම් | 37,304,780 | 43,882,269 | 41,702,007 | 15,496,017 | 25,379,060 | 28,595,523 | 25,914,250 | 13,315,755 |
| **එකතුව** | **58,403,380** | **62,442,074** | **60,560,452** | **17,530,335** | **43,841,760** | **46,658,597** | **44,015,689** | **15,648,713** |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු කඩ කාමර 26 කින් ලැබිය යුතු කඩ කුලී රු.981,285 ක් අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | රු.165,900 ක් අයකර ගෙන ඇති අතර ඉතිරි හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු වාහන කුලියට දීමෙන් ලැබිය යුතු කුලී රු.770,040 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | තහවුරු කරගත නොහැකි හිඟ කුලී හඳුනා ගැනීම සඳහා ඉදිරියේදී ධාවන සටහන් පරීක්ෂා කරන බවත්, දැනට සොයාගත් තොරතුරු අනුව අදාළ පාර්ශවයන් දැනුවත් කල බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු ටෙන්ඩර් දේපල 03 කින් ලැබිය යුතු රු.98,124 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු.90,750 මුදලක් අය කර ගැනීම සඳහා නඩු පවරා ඇති අතර ඉතිරි රු.7,374 කපා හැරීම සඳහා ආණ්ඩුකාරවරයාට ලිපි යොමු කළ බව | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම මත්ස්‍ය අලෙවිසැලෙන් ලැබිය යුතු කුලී රු.80,539 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඉ) | 2022 දෙසැම්බර් 23 දිනැති අංක 2312 දරණ ගැසට් පත්‍රය ප්‍රකාරව ස්ථිර දැන්වීම් පුවරුවක් වෙනුවෙන් අයකළ යුතු ගාස්තු රු.118,940 ක් අඩුවෙන් බිල්කර තිබුණි. | අයකළ යුතු මුදලෙන් රු.8,000 ක් අයවී ඇති බවත්, ඉතිරි මුදල අයකර ගැනීමට ආයතන දැනුවත් කර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඊ) | 2023 වර්ෂයේදී ප්‍රදර්ශනය කර තිබූ දීප ව්‍යාප්ත දැන්වීම් පුවරු ඒකක 06 ක් හඳුනාගෙන සමීක්ෂණ වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු නොකිරීම මත සභා අරමුදලට අහිමි වූ ආදායම රු.77,580 ක් විය. | ආදායම් අයකර ගැනීම සඳහා ආදාළ ආයතනවල කළමනාකාරිත්වය දැනුවත් කළ බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ජල ගාස්තු රු.14,752,327 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු.7,810,570 ක් අයකර ගෙන ඇති බවත්, ඉතිරි මුදල් අයකර ගැනීමට ජල සම්බන්ධතාවයන් විසන්ධි කිරීමේ කටයුතු දැනට සිදුකරනු ලබන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඌ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.2,043,662 ක් හා රු.20,593,650 ක් විය. | ලැබිය යුතු උසාවි දඩ මුදලින් රු.1,646,332 ක් හා ලැබිය යුතු මුද්දර ගාස්තු මුදලින් රු.6,758,668 ක් ලැබී ඇති බව. | හිඟ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 පෙබරවාරි 16 දින ගබඩාවේ පැවති වීථි පහන් භෞතිකව පරීක්ෂා කිරීමේදී වටිනාකම රු.142,780 ක් වූ 200W ෆ්ලෑෂර් ලයිට් ඒකක 22 ක ඌනතාවක් නිරීක්ෂණය වූ අතර ඒ සම්බන්ධයෙන් සිදුකළ පරීක්ෂාවේදී, 2018 වර්ෂයේ අගෝස්තු මස සිට නොවැම්බර් මස දක්වා සභිකයන් 11 දෙනෙකු වෙත 200W ෆ්ලෑෂර් ලයිට් 22 ක් නිකුත් කර තිබුණද ඒවා නැවත සභාවට භාර නොදීම මත මෙම ඌනතාවය ඇති වී තිබුණි. තවද 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව තුළ 200W ෆ්ලෑෂර් ලයිට් ශේෂය ලෙජරය අනුව හා තත්‍ය ශේෂය 56 ක් ලෙස සමාන කර පෙන්වීම තුළ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිලධාරීන් වගකීම් විරහිතව කටයුතු කර තිබුණි. | එක් මහජන නියෝජිතයෙක් ෆ්ලෑෂර් 02ක් භාර දී ඇති අතර, අක්‍රිය ෆ්ලෑෂර් 27 ක් 2023 භාණ්ඩ සමීක්ෂණ නිර්දේශයන්ට අනුව වෙන්දේසි කළ බව. | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිලධාරීන් වගකීම් සහිතව කටයුතු කලයුතුය. |
| (ආ) | සභාව භුක්ති විඳින ඉඩම් හා ගොඩනැගිලි 16 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වනවිටත් කටයුතු කර නොතිබුණි. | ඉඩම් පවරා දීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ගයන් කඩිනමින් සිදු කරන බව. | වත්කම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කලයුතුය. |

### 3.2 ව්‍යාපෘති, කතර්ව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට වාර්ෂික අයවැය ලේඛනය මඟින් ප්‍රතිපාදන වෙන්කර තිබූ එකතු වටිනාකම රු.1,163,063 ක් වූ සංවර්ධන යෝජනා 03 ක් වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි. | ඇස්තමේන්තුගත මුදලට කොන්ත්‍රාත්තුව ඉටුකිරිමට අපහසු බව කොන්ත්‍රාත්කරුවන් දන්වා ඇති බව. | අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කර තිබූ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1 (අ) වගන්තිය අනුව ප්‍රසම්පාදනය කිරීමට ඇති භාණ්ඩ හෝ වැඩ සඳහා පිරිවිතර අදාළ ප්‍රසම්පාදන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට වඩා පටු ආකාරයට විස්තර නොකළ යුතු වුවත්, එකතු වටිනාකම රු.1,451,800 ක් වූ මිලදී ගැනීම් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව දැනට මිලදී ගැනීම් කටයුතු සිදුකරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව සඳහා එකතු වටිනාකම රු.604,998 ක් වූ වායු සමීකරණ යන්ත්‍ර 02 ක් මිලදී ගෙන තිබූ අතර ඊට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව තුළ සාධාරණ මිල පිරිවිතරය පමණක් සැලකිල්ලට ගෙන තිබූ අතර වගකීම් කාලය, වර්ගය, නිෂ්පාදිත රට යන වැදගත් පිරිවිතර සැලකිල්ලට නොගෙන නිර්දේශ ලබාදීම තුළ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6 (අ) (ii) වගන්තියට අනුව කටයුතු කර නොතිබුණි. | වායුසමීකරණ යන්ත්‍ර 02 නිසි පරිදි සවිකර ඇති බැවින් තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ මත ගෙවීම් කළ බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (අ) වගන්තිය අනුව යම් සාමාජිකයෙකු ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව යන කමිටු දෙකේම සාමාජිකයකු නොවිය යුතු වුවත්, එපරිදි කටයුතු නොකර එකතු වටිනාකම රු.1,952,498 ක් වූ මිලදී ගැනීම් දෙකකට අදාළව පත්කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයකු ප්‍රසම්පාදන කමිටුවේද සාමාජිකයකු ලෙස කටයුතු කර තිබුණි. | ප්‍රසම්පාදන කමිටුවට අදාළ නොවන සාමාජිකයකු තාක්ෂණික ඇඟයීම් කමිටුව සඳහා පත්කිරීමට කටයුතු කර ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාර්ග සංවර්ධන ව්‍යාපෘති 04 කට අදාළ මාර්ගයන් කොන්ක්‍රීට් කිරීම සඳහා යොදාගත යුතු මාර්ග මිල ගණන් ලේඛනයේ ST – 047 රේටය යොදා නොගෙන වෙනත් රේටයක් යොදා ගෙන ඇස්තමේන්තු සකස් කර ගෙවීම් කිරීමට කටයුතු කිරීම නිසා රු.342,485 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | ST - 048 රේටය යොදා ගැනීම තුළින් මාර්ගවල කල් පැවැත්ම වැඩිවන බව. | මාර්ග ඉදිකිරීම් සඳහා යොදාගත යුතු රේටය යොදා ගෙන ගෙවීම් කළ යුතු අතර වෙනත් රේටයක් යොදාගෙන ගෙවීම් කළ නොහැකි බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභා අරමුදලින් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබූ මාර්ග කොන්ක්‍රීට් කර ඉදිකිරීමේ ව්‍යාපෘති 04 කට අදාළව මාර්ග අගල් 06 ක් ඝණකමට කොන්ක්‍රීට් කළ බව දක්වමින් කොන්ක්‍රීට් කිරීමේ වැඩ විෂයය සඳහා රු.3,502,703 ක් ගෙවීම් කර තිබුණද අගල් 06 ක් ඝණකමට කොන්ක්‍රීට් කර ඇති බව පරීක්ෂණ වාර්තාවක් මගින් තහවුරු කර නොගෙන මුළු මුදලම ගෙවීම් කර තිබුණි. | තාක්ෂණ සේවා නිලධාරින්ගේ පූර්ණ අධීක්ෂණය මත ඉදිකිරීම් කල බව. | මාර්ගවල ඝණත්වය පරීක්ෂණ වාර්තාවක් මගින් තහවුරු කර ගෙන ගෙවීමට කටයුතු කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ අනුමත හා තථ්‍ය කාර්යය මණ්ඩලය පිළිවෙලින් 96 ක් හා 111 ක් වූයෙන් තනතුරු 09 කට අදාළ අතිරික්තතා 33 ක් විධිමත් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. | සංවර්ධන නිලධාරීන් 15 දෙනෙකු අතිරික්තව සිටින අතර,මෙම තනතුරු අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කිරීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කළ බව. | කාර්ය මණ්ඩලයේ අතිරික්තතා විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.6 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පරිසර ආරක්ෂණ බලපත්‍රයේ කොන්දේසි අංක 03 අනුව ඝණ අපද්‍රව්‍යවල ඇති ප්ලාස්ටික්, පොලිතින්, කඩදාසි, වීදුරු සහ යකඩ වෙන් වෙන් වශයෙන් තෝරා ඒවා ප්‍රතිචක්‍රීකරණය සඳහා අදාල ආයතන වෙත යොමුකල යුතු අතර, එසේ යොමු කරනු ලබන තෙක් සුදුසු ස්ථානයක සුළඟට ගසාගෙන නොයන ලෙස හා වර්ෂා ජලයට නිරාවරණය නොවන සේ විධිමත්ව ගබඩා කර තැබිය යුතු වුවත්, සභාව එපරිදි කටයුතු කර නොතිබුණි. | ගබඩා පහසුකම් නොමැති වීම මෙම තත්ත්වය හේතුවී ඇති බවත්, ඉදිරියේදී ගබඩා පහසුකම් සපයා ගැනීමට කටයුතු කරන බව. | බලපත්‍රයේ කොන්දේසි අනුව කටයුතු කළ යුතුය. |